**සෞම්‍යමූර්ති තොණ්ඩමන් අනුස්මරණ පදනම - 2021**

**-------------------------------------------------------------**

**1. මූල්‍ය ප්‍රකාශන**

**1.1 තත්ත්වාගණනය කළ මතය**

සෞම්‍යමූර්ති තොණ්ඩමන් අනුස්මරණ පදනමේ 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්ති වලට අදාල තොරතුරුද ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවලට අදාල සටහන්, වලින් සමන්විත 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, පදනමේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

**1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, පදනම අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය පදනම ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා පදනමේ අඛණ්ඩ පැවැත්මට අදාල කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

පදනමේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරික්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, පදනමේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර,එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසු බවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන් චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය ,ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් පදනමේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා පදනමේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ පදනමේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාල ලිඛිත නීතියකට හෝ පදනමේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, පදනම ක්‍රියා කර ඇති බව,

- පදනම සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- පදනමේ සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාල නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

## 1.5 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.5.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම

| අදාල ප්‍රමිතියට යොමුව සහිතව අනුකූල නොවීම | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 07 හි 72 ඡේදය ප්‍රකාරව ඉඩම් හා ගොඩනැගිලිවල පිරිවැය වෙන් වෙන්ව ගිණුම්වල හඳුනාගැනීමට කටයුතු කර නොතිබීම හේතුවෙන් ගොඩනැගිලි සඳහා ක්ෂය වෙන් කිරීමේදී එකතුව රු.277,679,780 ක්වූ ඉඩම් හා ගොඩනැගිලි වල මුළු පිරිවැයෙන් සියයට 50 ක් මත සියයට 02 ක් ක්ෂය කිරීම ආයතනයේ ක්ෂය ප්‍රතිපත්තිය ලෙස මූල්‍ය ප්‍රකාශන වල හෙළිදරව් කර තිබුණි. ඊට පටහැනිව 2005 වර්ෂයේ සිට 2021 වර්ෂය දක්වා මුළු පිරිවැය වටිනාකම මත ක්ෂය කර තිබීම හේතුවෙන් ගොඩනැගිලි වටිනාකම රු.42,678,276ක් වර්ෂයේ අතිරික්තය රු.2,776,798ක් අඩුවෙන් ද සමුච්චිත ඌනතාවය රු.39,901,478 ක් වැඩියෙන් ද මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි. | පිළිතුරු ලබා දී නොතිබුණි. | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 07ට අනුකූලව ක්ෂය කිරීම් නිවැරදිව සිදු කළ යුතුය. |

### 1.5.2 ගිණුම්කරණ අඩුපාඩු

පහත නිරීක්ෂණ කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණ | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂය තුල දී කෙරීගෙන යන වැඩ වෙනුවෙන් දරන ලද රු.26,377,072 ක මුදල මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ ආයෝජන ක්‍රියාකාරකම් යටතේ මුදල් ගලා යාමක් ලෙස දක්වා නොතිබුණි. | පිළිතුරු ලබා දී නොතිබුණි. | මුදල් ප්‍රවාහ ප්‍රකාශය නිවැරදිව පිළියෙල කළ යුතුය. |

**1.6. ලැබිය යුතු, ගෙවිය යුතු ගිණුම්**

**1.6.1 ලැබිය යුතු ගිණුම්**

| විගණන නිරීක්ෂණ | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට රු. 5,812,134ක් වූ ලැබිය යුතු ශේෂය වූ තුළ ඇතුලත් වර්ෂ 05 ක් ඉක්මවූ එකතුව රු. 4,566,973 ක ශේෂ අය කර ගැනීමට පදනම විසින් කටයුතු කර නොතිබුණි. | පිළිතුරු ලබා දී නොතිබුණි. | අයවිය යුතු ශේෂ අය කර ගැනීමට කටයුතු කළ යුතුය. |

**1.6.2 ගෙවිය යුතු ගිණුම්**

| විගණන නිරීක්ෂණ | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂය අවසාන දිනට රු.12,210,314ක් වූ ගෙවිය යුතු ණය ශේෂය තුළ ඇතුලත් වර්ෂ 5 ඉක්මවූ එකතු වටිනාකම් රු.7,742,490 ක ශේෂ නිරවුල් කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග පදනම විසින් ගෙන නොතිබුණි. | පිළිතුරු ලබා දී නොතිබුණි. | ගෙවිය යුතු ශේෂ නිරවුල් කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය. |

**1.7 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම**

| | නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | 2005 අංක 19 දරන සෞම්‍යමූර්ති තොණ්ඩමන් අනුස්මරණ පදනම පනත | | | |
| | (i) පනතේ 5 සහ 6 වන විධිවිධාන | පදනමේ අරමුණු ක්‍රියාවට නැංවීමේදීද බලතල, කාර්ය හා කර්තව්‍යන් ඉටුකිරීමේදීද අවශ්‍ය විය හැකි තීරණ ගැනීම සහ සමාලෝචනයන් සිදු කිරීම සඳහා පදනමේ කළමනාකරණ මණ්ඩලය සමාලෝචිත වර්ෂය තුළ දී කිසිදු රැස්වීමක් පවත්වා නොතිබුණි. | පිළිතුරු ලබා දී නොතිබුණි. | පනත ප්‍රකාරව කළමනාකරණ මණ්ඩලය රැස්වීම් පැවැත්වීමට කටයුතු කළ යුතුය. |
| | (ii) පනතේ 14 වන විධිවිධානය | පදනම විසින් එක් එක් මුදල් වර්ෂය අවසන් වීමෙන් පසු මාස 06 ක කාලසීමාවක් ඇතුලත ඒ වර්ෂය තුල පදනමේ කටයුතු පිළිබඳ සම්පූර්ණ විස්තරයක් දැක්වෙන වාර්තාවක් අමාත්‍යවරයා වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතු අතර ඒ වාර්තාව අදාල වන වර්ෂයට පසුව එළඹෙන වර්ෂයේ අවසානයට පෙර අමාත්‍යවරයා විසින් | පිළිතුරු ලබා දී නොතිබුණි. | පනත ප්‍රකාරව ඉදිරිපත් කළ යුතු වාර්තාව අදාල අමාත්‍යවරයා සහ පාර්ලිමේන්තුවවෙත ඉදිරිපත් කිරීමට කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළ යුතු වුවත් ඒ අනුව කටයුතු කර නොතිබුණි. | | |
| (ආ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය | | | |
| (i) මුදල් රෙගුලාසි 371(2) (ආ) | අතුරු අග්‍රිමයක් එය දෙන ලද කාර්යය නිමකල විගසම පියවිය යුතු වුවද, 2010 සිට 2015 කාලපරිච්ඡේදය තුල ලබාදෙන ලද එකතුව රු.1,004,958 ක් වූ අත්තිකාරම් පියවා ගැනීමට 2024 දෙසැම්බර් 31 දින වන විටත් කටයුතු කර නොතිබුණි. | පිළිතුරු ලබා දී නොතිබුණි. | මුදල් රෙගුලාසි ප්‍රකාරව අතුරු අග්‍රිම පියවීමට කටයුතු කළ යුතුය. |
| (ii) මුදල් රෙගුලාසි 756, 757(2) | 2021 වර්ෂය සඳහා භාණ්ඩ සමීක්ෂණයක් සිදුකර අදාල සමීක්ෂණ වාර්තාව විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි. | පිළිතුරු ලබා දී නොතිබුණි. | මුදල් රෙගුලාසි ප්‍රකාරව භාණ්ඩ සමීක්ෂණයක් සිදුකර සමීක්ෂණ වාර්තා විගණකාධිපති වෙත ඉදිරිපත් කිරීමට කටයුතු කළ යුතුය. |
| (ඇ) ශ්‍රී ලංකා ප්‍රජාතන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහය | | | |
| XXIX පරිච්ඡේදයේ 13 වගන්තිය | 2016 වර්ෂය තුලදී ලබාදුන් එකතුව රු.1,415,800 ක් වූ උත්සව අත්තිකාරම් 2024 දෙසැම්බර් 31 දින වන විටත් නැවත අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | පිළිතුරු ලබා දී නොතිබුණි. | හිඟ උත්සව අත්තිකාරම් අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ඇ) 2003 ජුනි 02 දිනැති අංක PED/*12* දරන රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තු චක්‍රලේඛයේ 6.5.1 ඡේදය | මුදල් වර්ෂය අවසාන වී දින 60 ක් ඇතුලත සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන සමඟ කෙටුම්පත් වාර්ෂික වාර්තාව විගණකාධිපති වෙත ඉදිරිපත් කලයුතු වුවද 2024 නොවැම්බර් 18 දින ඉදිරිපත් කර තිබූ අතර 2022,2023 හා 2024 වර්ෂයන්ට අදාල මූල්‍ය ප්‍රකාශන සහ කෙටුම්පත් වාර්ෂික වාර්තා මෙම වාර්තාවේ දින දක්වාම විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි. | පිළිතුරු ලබා දී නොතිබුණි. | චක්‍රලේඛය ප්‍රකාරව මූල්‍ය ප්‍රකාශන හා කෙටුම්පත් වාර්ෂික වාර්තා ඉදිරිපත් කිරීමට කටයුතු කළ යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| (ඉ) | 2014 පෙබරවාරි 17 දිනැති අංක 01/2014 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය | පදනම විසින් 2021 සිට 2025 දක්වා වර්ෂයන්ට අදාල වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම පිළියෙල කිරීමට කටයුතු කර නොතිබුණි. | පිළිතුරු ලබා දී නොතිබුණි. | චක්‍රලේඛය ප්‍රකාරව වාර්ෂිකව ක්‍රියාකාරී සැලැස්ම පිළියෙල කළ යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු.23,840,051 ක අතිරික්තයක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ අතිරික්තය රු.2,759,732ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.21,080,319 ක වර්ධනයක් නිරීක්ෂණය විය. මෙම වර්ධනයට රජයේ ප්‍රදාන හා වෙනත් ආදායම් වැඩිවීම ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණ | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| රම්බොඩ තොණ්ඩමන් සංස්කෘතික මධ්‍යස්ථානයේ පවත්වාගෙන ගොස් තිබූ පූර්ණ කාලීන පාඨමාලා 06 ක් ප්‍රතිපාදන නොමැති වීම හේතුවෙන් 2015 වර්ෂයේ සිට එම පාඨමාලා පැවැත්වීම නතර කර තිබුණි. තවද, 2020 සහ 2021 වර්ෂයන්හිදී පාසල් සිසුන් 216 දෙනෙකු සඳහා ආරම්භ කරන ලද පාඨමාලා 03 හි අධ්‍යයන කටයුතු 2024 දෙසැම්බර් 31 දින වන විටත් නතර කර තිබුණි. මෙලෙස පූර්ණ කාලීන පාඨමාලාවල අධ්‍යයන කටයුතු නොපැවැත්වීම හේතුවෙන් සිසුන් 72 දෙනෙකුගේ ධාරිතාවයෙන් යුතු කාන්තා නේවාසිකාගාරය වසා දමා නිෂ්කාර්යව පැවතුණි. | පිළිතුරු ලබා දී නොතිබුණි. | වත්කම් උපරිම කාර්යක්ෂමතාවයකින් උපයෝජනය කිරීමට කටයුතු කළ යුතුය. |